# පැෂන් ෆෘට් හෙවත් වැල් දොඩම් වගා ව්‍යාපාරය වැඩි කරමු

බිඳුනුවැව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ කෘෂිකර්ම නිලධාරී
එන්. පී. චන්ද්‍රසිරි ද සිල්වා

මෑතකදී, කෘෂිකර්ම පර්යේෂණ හා පුහුණු ආයතනය මගින් කරන ලද සමීක්ෂණයකින්, ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල පළතුරු පාරිභෝජනය වසරකට කි. ග්‍රෑම් 5–6 බවත්, එය අනෙකුත් ආසියාතික රටවල් හා සංසන්දනයේදී ඉතාම අඩු අගයක් බවත් පෙන්වා දී ඇත. (1986 මැයි 25 ඉරිදා ඔබ්සවර් පුවත්පත) මෙම පෙන්වාදීම කෙරෙහිවත් සැලකිලිමත්වී, අනෙකුත් වගාවන්ට දක්වන අවධානයම පළතුරු වගාවටත් යොමු කිරීමට අප උනන්දු විය යුතුය.

පළතුරු අතර වැල් දොඩමද වැදගත් ජනප්‍රිය පළතුරක් ලෙස ඉදිරියෙන් සිටී. ඵලයේ ඇති පෝෂ්‍යදායී ගුණයටත්, එහි ලෙලිවලින් සාදන ජෙලි වලටත් අමතරව, වැල් දොඩම් පත්‍ර අමු එළවළුවක් වශයෙන්ද පාවිච්චියට ගනී. දැනට වාණිජමය වටිනාකමක් ඇති කහ පැහැති වර්ගයේ හා රහංගල දෙමුහුමේ පත්‍රවල සයනෝජනික් ග්ලයිකොසයිඩ නැමැති විෂ වර්ගයක් ඇති බව පෙන්වාදී ඇත. නමුත් මෙම විෂ ද්‍රව්‍ය දම් පැහැති වර්ගයේ නැති බවත් දැනගැනීම වැදගත්ය. (1983 ජූලි - සැප්තැම්බර් කෘෂි කලාපය)

වගාවට සුදුසු පස

හොඳින් ජලය බැසයන අතරම වියළි කාල ගුණවලදී වැල් වර්ධනය සඳහා අවශ්‍ය පමණ තෙතමනය රඳවාගත හැකි පසක් වීම වැදගත්ය. එම නිසා වැලි පසක් තෝරා නොගන්න. එසේම වර්ෂා කාලයේදී වගුරු තත්වයට පත්වන තෙත් කලාපයේ පහත් බිම්වලද, වැල් දොඩම වගා නොකළ යුත්තේ මුල් කුණුවී වැල් මැරී යන නිසාය.

වගාකරන වර්ග

දැනට වර්ග 11 ක් පමණ හඳුනාගෙන ඇත. එයින් ශ්‍රී ලංකාවේ බහුලවම වගා කරන්නේ කහ පැහැති වර්ගයත්, දම් පැහැති වර්ගයත්, ඒ වර්ග දෙකම දෙමුහුන් කර ලබාගෙන ඇති රහංගල දෙමුහුමත් වේ.

දම්පාට දඬු හා කොළපාට නටුවලින් යුක්ත බැවින් ඉතා පහසුවෙන් හඳුනාගත හැකි කහපාට වර්ගය පහතරට තෙත් කලාපයේත්, වැසි රහිත කාල වලදී ජල සම්පාදනයක් යටතේ වියළි කලාපයේත් හොඳින් වැඩේ. කොලපාට දඬු හා කොලපාට නටු සහිත දම්පාට වර්ගය මැද හා කඳුරට ප්‍රදේශවල මැනවින් වැඩේ. රහංගල දෙමුහුම දැනට මැදරට ප්‍රදේශවල (උදා: බණ්ඩාරවෙල, රහංගල) වගාකර හොඳ අස්වැන්නක් පෙන්වා දී ඇත. දම් පැහැති වර්ගයේ ගෙඩි, කහ පැහැති වර්ගයේ ගෙඩි වලට වඩා කුඩාය. නමුත් එහි සීනි ප්‍රමාණය වැඩිවන අතර, ඇඹුල් රසය අඩුය.

අවශ්‍ය පැල බෝකරගැනීම

මේ සඳහා වැල් දොඩම් බීජ හෝ දඬු කැබලි ගත හැකි වුවත්, ඉතා හොඳ මව් ගසක් තෝරා ගැනීමට උපරිම උත්සාහය යොදන්න. කෘෂි විද්‍යාඥයින් පවසන්නේ තම ප්‍රදේශයේම වගාවන තොරතුරු හොඳින් දන්නා, රෝග හා කෘමි හානි-වලින් තොර, මව් ගස් වලින් බීජ හෝ දඬු කැබලි ලබා ගැනීම වගාවට මූලික වශයෙන් ලබාදෙන ඉතාම හොඳ අත්තිවාරමක් බවයි.

(අ) දඬු කැබලි මගින්

කහ පැහැති වර්ගයට සෑදෙන වෛරස් රෝග දඬු කැබලි මගින් ප්‍රචාරනය වන නිසා දඬු කැබලි මගින් කහ පැහැති වර්ගයේ පැල ප්‍රචාරනයේදී ඉතාමත්ම පරික්ෂාකාරී විය යුතු බව අවධාරණ-යෙන් සඳහන් කළ යුතුය.

මෙහිදී වෛරස් රෝග කිසිසේත්ම දක්නට නැති අධික ලෙස ඵල දරණ, වැල් දොඩම් වැල් තිබියදීත්ම (ස්ව අසංගත භාවය වැළැක්වීමට)

අවුරුද්දක් පමණ වයසැති, දඩු තෝරා ගන්න. (වැල් කප්පාදු කරන අවධියේදී මෙම දඩු කැබලි ගත හැක). මෙවායින් සෙ. මී. 30-35 ක් දිග පර්ව 3 ක් ඇති දඩු කැබලි ගෙන එහි වඩා මෝරපු පැත්තේ එක් පර්වයක් යටව සිටින සේ වැලි තවානක සිටුවන්න.

මෙසේ සිටුවා සති 3-4 කට පසු මුල් අදී. වැලි තවාන පොලිතීන් වලින් ආවරණය කිරී-) මෙන් මුල් ඇදීම ඉක්මන් වන බව පෙනේ) මුල් ඇදුනු පසු බදුන් මිශ්‍රණය සහිත පොලිතීන් මලුවලට දඩු කැබලි මාරු කරන්න.
(බදුන් මිශ්‍රණය - මතුපිට පස් 2: කාබනික ද්‍රව්‍ය 1: වැලි 1:) තවත් හොඳින් මුල් ඇදුනු විට, එනම් වයස මාස 3 වූ විට ක්ෂේත්‍ර යේ සිටුවීමට ගන්න.

රහංගල දෙමුහුන් පැල බෝකර ගත යුත්තේ එහි දඩු කැබලි වලින් පමණි. එහි බීජ වලින් පැල ලබාගත්විට, රහංගල දෙමුහුමේ ලක්ෂණ නොලැබේ. දඩුකැබලි සිටුවීමෙන් අස්වැන්න මාස 9 කදී පමණ ලබාගත හැක.

**(ආ) බීජ මගින් පැල ලබාගැනීම**

බීජ මගින් වෛරස් රෝග ප්‍රචාරණය නොවේ. නමුත් මව් ශාඛයේ දක්නට ලැබෙන ලක්ෂණ එමගින් ලබාගැනීමට නොහැකි වේ. මෙය දුර්වල තාවයකි. එසේම බීජ මගින් ලබාගන්නා පැල, අස්වැන්න දීමට මාස 11 – 12 පමණ කල් ගතවේ.

හොඳින් ඉදුනු ගෙඩි වලින් බීජ ලබාගෙන තවාන් පාත්තිවල සෙ. මී. 1 ½ ක් පමණ ගැඹුරින් සෙ.මී. 23 × 10 පරිමාණයට සිටුවන්න. පත්‍ර 4-5 ඇතිවූ විට බදුන් මිශ්‍රණය සහිත පොලිතීන් මලුවලට මාරුකර පසුව සෙ.මී. 20 - 25 පමණ උස්වූ විට ක්ෂේත්‍රයේ සිටුවීමට යොදගන්න.

**ජේලි අතර පරතරයන් හා සිටුවීම**

ජේලි අතර දුර මීටර් 2 ක්ද, පැල අතර දුර මීටර් 5 ක්ද, පැල සිටුවන වලවල් සෙන්ටිමීටර් 45×45×45 ප්‍රමාණයේද වීම සුදුසුයි. පැල සිටුවීමට සති 2 කට පමණ කලින් සිටුවන වලේ අඩියට මතුපිට පස් දමා පසුව කොම්පෝස්ට් හෝ වියළි ගොම, වලෙන් ඉවත්කළ පස් සමග මිශ්‍රකර දමන්න. (උඩරට ආම්ලික තාවය සාමාන්‍යයෙන් වැඩි පස්වලට ආම්ලිකතාවය අනුව ඩොලමයිට් යෙදිය යුතුයි)

ක් එක් ජේලියේ පැලයට දෙපැත්තෙන් මීටර් 2.5 දුරකින් මීටර් 2.2 ක් උස කණු සිටුවා කටුකම්බි තනි පොටක් මෙම උස කණුවල ඉහළ කොන් අතර ඇද, එය දිගේ පැෂන් පෑට් වැල් හැරවීම කළ හැක. කණුවලට ග්ලිරිසිඩියා, වෙල්ඇහැල ආදියද යොදගත හැක.

ගෙවතුවල නම්, වැටවල් දිගේ මීටර් 2.2 උස කණු සිටුවා කලින් විස්තර කළ අන්දමට කම්බි අදින්න. ගෙවත්තේ වගා කරන විට පැල 3 ක් වත් තබාගැනීම වැදගත්ය. (සමහරවිට එක පැල යක් පමණක් තිබීමෙන්, එහි මල් හට ගත්තද, ගෙඩි ඇතිවීමක් සිදු නොවීමට පුළුවන)

**වැදගත්**

පැලය සිටුවීමේදී සෙන්ටිමීටර් 25 ක් පමණ ජේලියේ මැදින් ඉවතට වනසේ සිටුවා පසුව වැල කම්බියට යැවීමෙන් වැදගත් වාසි කිපයක් ඇතිවේ. ඒවා නම් ගසේ පාමුල අසල පිරිසිදු කිරීමට පහසුවීම පාමුල කොටසට හොඳින් හිරුඑළිය ලැබීම. පොහොර දැමීමට පහසුවීම, මුලේ පාමුල කොටස කුණුවීම (Coller Rot) වළක්වා ගැනීමට හැකි වීම.

**පැලකරන කාලය**

ජූනි/ජූලි මාසවල සිටුවීම කළවිට පළමුවන අවුරුද්දේ අස්වැන්න ආර්ථිකවත්, නියමි කාල යටත් ලබාගත හැකිබව පෙනී ගොස් ඇත.

**වැල්දෙඩම් වලට සුදුසු රසායනික පොහොර මිශ්‍රණය සාද ගැනීම**

යූරියා කිලෝ ග්‍රෑම් 13 ක්, රොක් පොස්පේට් කිලෝ ග්‍රෑම් 25 ක් මියුරියේට් ඔෆ් පොටෑෂ් කි. ග්‍රෑම් 12 ක් සමග මිශ්‍රකර සාදගන්නා කි. ග්‍රෑම් 50 මිශ්‍රණය තෙත් කලාපයටත්, යූරියා කි. ග්‍රෑම් 15 සාන්ද්‍ර පොස්පේට් කි. ග්‍රෑම් 23, මියුරියේට් ඔෆ් පොටෑෂ් කි. ග්‍රෑම් 12 ක් මිශ්‍රකර සාදගන්නා කි. ග්‍රෑම් 50 මිශ්‍රණය වියළි හා අන්තර් මාධ්‍ය කලාපයටත්, භාවිතා කළ හැක.

**රසායනික පොහොර යොදන අවස්ථා**

කලාපයට අනුව සුදුසු පොහොර මිශ්‍රණය සකසා ගෙන

සිටුවීමේදී වළකට ග්‍රෑම් 225

සිටුවා මාස 6 කදී ග්‍රෑම් 225 (වර්ධනයේ බාල බවක් පෙනේ නම්, සිටුවා මාස 2 දී නැවත ග්‍රෑම් 225 ක් දමන්න). මේ අවස්ථාවේදී වැලේ සිට සෙ. මී. 25 ක් ඈතින් පොහොර යොදන්න.

2 වන වසරේදී ග්‍රෑම් 450

3 වන වසරේදී ග්‍රෑම් 675

4, 5, 6, වන වසරවලදී ග්‍රෑම් 900 බැගින් යොදන්න.

දෙවන වසරේ සිට පොහොර යොදන විට වැල් පාමුල සිට අඩුම වශයෙන් සෙන්ටි මීටර් 30–40 ක් වත් ඈතින් දමන්න.

අනවශ්‍ය ලෙස පොහොර නොදමා ගස් සංඛ්‍යාවට අනුකූලව අවශ්‍ය පොහොර මිශ්‍රණ ප්‍රමාණය සාදා ගැනීම සඳහා උවමනා පොහොර වර්ගවල ප්‍රමාණයන් ගණනය කරගන්න. පොහොර දැමීමට පෙර යටත් පිරිසෙයින් ගසේ පාමුල වටාවත් වල් පැල උදුරන්න.

**හොඳ අස්වැන්නකට වැල් පුහුණුව හා කප්පාදු කරන අන්දම**

නිරෝගී පැලයක් වලෙහි සිටුවා ලණුවකින් හෝ ආධාරකයක් ඔස්සේ කම්බියෙන් සෙන්ටි මීටර් 60 ක් පමණ ඉහළට යන තෙක් වැඩීමට ඉඩහැර (පහළ සියළුම පැති රිකිලි ඉවත්කර) පසුව කම්බියට සෙන්ටි මීටර් 10 ක් පහළින් එම ප්‍රධාන වැලෙන් කපන්න. පසුව ඇතිවන අංකුරවලින් 2 ක් පාර්ශ්වික ශාඛා ලෙස යවා අනික්වා ඉවත් කරන්න. ද්විතීයික ශාඛා අතර සෙන්ටිමීටර් .25 ක් පමණ පරතරයක් තබා, පසුව ඒවායේ ඇතිවන පහුරු කඩා දැමීමට අමතක නොකරන්න. නැතිනම් වැල් එකිනෙක පැටලේ. මෙම ද්විතීයික ශාඛාවල ගෙඩි හටගැනේ.

**අස්වැන්න නෙලීමෙන් පසුව කරන කප්පාදුව**

පළමු අස්වැන්න නෙලාගත් පසු අලුත් ද්විතීයික ශාඛා ඇතිකිරීමට පරණ ද්විතීයික ශාඛාවල ඉහළින් සෙන්ටිමීටර් 23 (අඟල් 9) ක් පමණ ඉතිරිවන සේ අංකුර 2 ක් හා පත්‍ර 1ක් ඉතිරි කර කපන්න. ඉන්පසු සෑම වර්ෂයකම අස්වැන්න නෙලා අංකුර 2 පත්‍ර 1 බැගින් ඉතුරු-කර කප්පාදු කරන්න.

මල් පිපීමට මාස 3 කට පමණ පෙර කප්පාදුව කරන්න. එවිට ආර්ථික අස්වැන්නක් ගත හැකි අතර, වැල් අනවශ්‍ය ලෙස බිම දිගේ වැඩීමද සිදු නොවේ. සාමාන්‍යයෙන් මාර්තු මුල් භාගයේදී මල් පිපේ.

එසේම 1 වන වසරේ අංකුර 3 ක්ද, 2 වන වසරේ 2 ක්ද, 3 වන වසරේ 1 ක්ද ඉතිරිවන පරිදි කප්පාදු කළ හැක.

**අස්වැන්න**

සාමාන්‍ය නඩත්තුවක් මත දම් ප්‍රභේදයෙන් වසරකට අක්කරයකින් කිලෝ ග්‍රෑම් 1800-2700 ද, කහ ප්‍රභේදයෙන් වසරකට අක්කරයකින් කිලෝ ග්‍රෑම් 2700 – 6900 පමණද ලබාගත හැක. ශ්‍රී ලංකාවේ තත්ව යටතේ හොඳ නඩත්තුවක් මත කහ ප්‍රභේදයෙන් වසරකට අක්කරයකින් කිලෝ ග්‍රෑම් 9000 – 14000 ක් වුවද ලබාගත හැකි බව සඳහන් වේ. කහ ප්‍රභේදයේ ආර්ථික ජීවී කාලය වසර 3–4 ක් පමණ වේ. රහංගල දෙමුහුම් වැලකින් වසරකදී කිලෝ ග්‍රෑම් 25 ක් පමණ ලබාගත හැකි බවත්, ආර්ථික ජීවී කාලය වසර 2-6 බවත්, නිරීක්ෂණයකර ඇත. ආර්ථික ජීවී කාලයට පසුව වගාව අලුත් කරන්න.

**වැඩි අස්වැන්නකට කෘත්‍රිම පරාගනය කළ යුතුමය**

සමහර වැල් දෙඩම් වැල්වල මල් බොහොමයක් හටගත්තත්, ගෙඩි හටගනුයේ කීපයක් බව ඔබද බොහෝ විට නිරීක්ෂණය කර ඇත. අධික යුෂ ඇති විශාල ඵල වැඩි ප්‍රමාණයක් ලබාගැනීමට නම් කෘත්‍රිම පරාගනයක් සිදුකළ යුතුමය. මේ සඳහා මෘදු ලෙස ඇඟිලි වලින් ප්‍රථමයෙන් පරාගධානීන් පසුව කලංක තුනේම එම පරාග හොඳින් තැවරෙනසේ කලංකයන් පිරිමදින්න.

ස්වාභාවිකව වඩු කුරුමිණියාගෙනුත්, ඉතා අඩුවෙන් මී මැස්සා ගෙනුත්, වැල් දෙඩම්වල පරාගනය සිදුවේ. මහඉලුප්පල්ලමේදී කෘත්‍රිම පරාගනය නොකර වැලකින් ගෙඩි ලබාගෙන

ඇත්තේ මල් 100 කින් ගෙඩි 10 – 15 පමණි. පස්වරු 12-6 අතරදී කෘත්‍රිම පරාගනය කර, 80% ක් පමණ ඵල ලබාගෙන ඇත. (ප.ව. 2.00 පමණ ආසන්න කාලයේදී පමණක් අඩු ඵල පිහිටීමක් දී ඇත)

කහ ප්‍රභේදයේ මල් පිපෙන වේලාවට (ප. ව. 12 ට පමණ) තද වැසි ලැබී පරාග සේදී යාමෙන් ඉතා අඩු ඵල පිහිටීමක් සිදුවේ. එවැනි අවස්ථාවලදී දවසේ පසු භාගයේ පිපෙන්නට ඇති මල් උදේ 10 ට පමණ බලෙන් විවෘත කර කෘත්‍රිම පරාගනය කිරීම මගින් හෝ පරාගධානි, කුප්පියකට එකතු කර වර්ෂාව අවසන් වූ පසුදිනම පරාගනය කිරීමෙන් 50-60% පමණ ඵල ලබාගත හැකි බව පෙන්වාදී ඇත.

රහංගල දෙමුහුමෙහිදී ස්වාභාවික තත්වය යටතේ හොඳ ඵල පිහිටීමක් ඇති නොවීමට හේතුවක් විය හැක්කේ මල් විවෘත වන වේලාවේදීම (පෙ.ව. 9.50 ට පමණ) පැමිණෙන මී මැස්සන් විසින් පරාගනයට අවශ්‍ය තරමවත් පරාග ඉතිරි නොකරම, පරාග ගෙනයැම බව පෙනීගොස් ඇත. මෙනිසා එහිද මල්පිපෙන විට පරාගධානි කඩා එකතුකර පරාගනය කිරීම මගින් හොඳ ඵල පිහිටීමක් ලබාගතහැක.

**රෝග හා කෘමි හානි කීපයක්**

**(අ) රෝග**

**(01) වෛරස් රෝග**

තෙත් කලාපයේ මෙය බහුලව දක්නට ලැබේ. කහ වර්ගය මෙයට වැඩියෙන් පාත්‍රවේ. උඩරට වගාකරන දම් වර්ගයට මෙම රෝගය සෑදී නැති බව නිරීක්ෂණයකර ඇත. කුඩිත්තන් මගින්, පරාග මගින්, කපන පිහි හා යුෂය මගින්ද වෛරස් ප්‍රවාහනය වේ. කෙසෙල්, පැපොල්, සිට්‍රස්, මිරිස්, පිපිඤ්ඤා කුලයේ බෝග සමග පැෂන් එකට වගා නොකිරීමෙන් මර්ධනය කරංගත හැක. රෝග පාත්‍රී වැල් වහාම උදුරා පුලුස්සා විනාශ කළ යුතුයි.

**(02) පාමුල කුණුවීම**

දිලීරයක් මගින් බෝවේ. කහ, දම් හා රහංගල දෙමුහුම යන වර්ග තුනටම සෑදේ. විශේෂයෙන් දක්නට ලැබෙන්නේ තෙත් කලාපයේය. රෝගය සෑදෙන්නේ සිටුවා දෙවන අවුරුද්දේය. එකෙසේදයත් වැල වැඩෙන විට ප්‍රධාන කඳ පැලීමෙන් පොළවට ආසන්නයේ, පැලුනු ස්ථානයෙන් දිලීරය ආක්‍රමනය කිරීම නිසාය. මර්ධනය අසීරුය. පාමුල ප්‍රදේශය පිරිසිදුවට තබා හිරු එළිය වැටීමට සැලැස්වීම තරමක් හොඳ පූර්ව ප්‍රතිකාරයක් ලෙස පෙනී ඇත.

**(03) කොල පුල්ලි රෝගය (ඕල්ටනේරියා පැසිෆ්ලෝරා)**

උෂ්ණ තෙත් කාලගුණයක් පවතින විට මෙම රෝගය ඇතිවේ. මෙයින් ගෙඩි, පත්‍ර හා කඳට බරපතල ලෙස හානි ඇතිවේ. කොළ හා ගෙඩිවල දුඹුරු පාට කවාකාර පුල්ලි ඇතිවේ. රෝගී පත්‍ර හා ගෙඩි හැලේ. ගෙඩිවල ඇතිවන රෝග පුල්ලි වතුර පිරුණු ආකාරයක් හා පත්‍ර තද කොළ පාටින් යුක්තය. පසුව මෙම පටක ඇතුලට ගිලා බසී. ක්‍රමානුකූලව වැල් කප්පාදුව මගිනුත්, දිලීර නාශකයක් ඉසීමෙනුත් මෙම රෝගය මගහරවා ගත හැක.

**(ආ) කෘමි හානි**

**(01) වැල් දෙඩම් කුරුමිනියා**

වැඩුනු කෘමියා කළු පැහැතිය. මිලි මීටර් 2 පමණ දිගය. උරස මිලි මීටර් 8ක් පමණ පළලය. වර්ෂා කාලයේදී දක්නට ලැබේ. පැෂන් වැල් තියුණු ලෙස කපා දමයි. මෙලෙස ද්විතීයික වැල් සම්පූර්ණයෙන්ම වෙන්වී වායව කොටස වියළී යාමට පුළුවන. රාත්‍රි කාලයේදී සැරිසරයි. බොහෝවිට විදුලි ආලෝකයේදී සැහවේ. එකතු කර විනාශ කිරීම මගිනුත්, හානිකොටස් හා වියළී ගිය කොටස් පුළුස්සා විනාශ කර කෘමි හානියේ වර්ධක අවධීන් විනාශ කිරීම මගිනුත් මර්ධනය කළ හැක. කෘමි නාශක යෙදීම මගින් මර්ධනය ආර්ථික නොවේ. ගම්පහ දිස්ත්‍රික්කයේ වැල්දෙඩම් වගාවට බරපතල හානි සිදුකරන කෘමියෙක් ලෙස වාර්තා වී ඇත.

**(02) වැල් දෙඩම් කඳට හානිකරන දළඹුවා**

දළඹුවා කඳට ඇතුල්වී හානි කරගෙන කඳ ඉහළට යයි. ජල වහනය හා ආහාර අඩුවී ඉහළ පත්‍ර මැරේ. හානිවූ හා හැරුණු වැල් විනාශ කිරීම මගින් මර්ධනය කළ හැක.

(මෙම ලිපිය පිළියෙල කිරීමේදී ගන්නොරුව මධ්‍යම පර්යේෂණ ආයතනයේ පර්යේෂණ නිලධාරීන් වන අයි. පද්මසිරි, ඉන්ද්‍රානි මැදගොඩ සහ බණ්ඩාර මැණිකේ තෙන්නකෝන් යන මහත්මීන් සහ උද්‍යාණ විද්‍යා අංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඇම්. ටී. ආර්. පින්ටෝ මහතාද දැක්වූ සහාය කෘතඥතා පූර්වකව සිහිපත් කිරීමට කතෘ කැමතිවේ)